**කඩුගන්නාව නගර සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන.**

**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 25 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.**

**1.2 මතය.**

**------------**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**-------------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

**---------------------**

**නගර සභාව සතු ඉඩම් කැබලි 21 ක සහ ගොඩනැගිලි 17 ක වටිනාකම් ලේඛනගත කොට, ගිණුම්ගත කර නොතිබුණි.**

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

**------------------------**

**ගිණුම් විෂයයකට අදාළ පාලන ගිණුම අනුව, ශේෂය රු.5,575,136 ක් වු අතර, උපලේඛන අනුව, ශේෂය රු.5,530,120 ක් වුයෙන්, රු.45,016 ක නොසසැඳීමක් විය.**

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.6,757,742 ක් වු අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂයන් හී එකතුව රු.612,026 ක් වී තිබුණි.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබු ගෙවියයුතු ගිණුම් ශේෂ 10ක එකතුව රු.2,289,409 ක් වූ අතර, එයින් රු.180,548 ක් වසර 03 ඉක්මවා තිබු ගිණුම් ශේෂ 02 ක එකතුවක් විය.**

**1.3.4 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**------------------------------------------------**

**පහත සදහන් අනුකූල නොවු අවස්ථා නිරික්ෂණය කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | **නගර සභා ආඥා පනතේ 255 අධිකාරියේ 127 ඉ (1)** | **සභා බල ප්‍රදේශයේ නිවසට අනතුරුදායක ලෙස පිහිටා ඇති අඩි 40-75 දක්වා උස මැහෝගනී ගස් 05 ක් ඉවත් කරන ලෙස දැනුම් දී වසර 04 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද, එවා ඉවත් කර නොතිබුණි.** |

| | |
|---|---|
| **(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 571** | **වසර 02 ක් ඉක්මවා තිබුණ රු.257,912 ක් වටිනා තැන්පතු 68 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.** |

**2. මූල්‍ය සමාලෝචනය.**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**---------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,744,810 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,380,695 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.1,635,885 ක අඩුවීමක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**---------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමග සැසඳීමේ දී, රු.7,114,194 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධයෙන් ආදායම් විෂයයන් 03 ක අඩුවීම හා වියදම් විෂයයන් 03 ක වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**--------------------------------**

**සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන අනුපාතය 1.36:1 වූ අතර, ඉකුත් වර්ෂයේ එම අනුපාතය 1.77:1 ක් වුයෙන්, නගර සභාවක පැවතියයුතු ප්‍රශස්ථ මට්ටමක කාරක ප්‍රාග්ධනය නොපවතින බව නිරීක්ෂණය විය. තව ද, සමස්ත ජංගම වත්කම්වලින් සියයට 35 ක් හෙවත්, රුපියල් මිලියන 11 ක් කර්මාන්ත හා විවිධ ණයගැතියන් වූ අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 86 ක් හෙවත්, රුපියල් මිලියන 20 ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**---------------------**

**(අ) වරිපනම් බදු**

**--------------**

**සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි වරිපනම් බදු හිග ආදායම රු.3,510,665 ක් වු අතර, වර්ෂය අවසානයේ හිගය රු.4,887,754 ක් දක්වා වර්ධනය වී තිබුණි.**

**(ආ) කඩ කුළී.**

**----------**

**පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.**

**(i) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.102,970 ක හිග කඩ කුළී ආදායමෙන් දීර්ඝ කාලයක සිට අය නොවී පවතින ශේෂය රු.68,770 ක් විය.**

**(ii) 2008 වර්ෂයේ සිට කඩුගන්නාව සති පොළ හිග ගාස්තුවලින් අය වියයුතු රු.252,856 ක මුදල අය කර ගැනීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.**

**(iii) ගිවිසුම්වලට පටහැනිව සභාව සතු කඩ කාමර අතුරු බදු දී තිබුණි.**

**(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

**---------------------------**

**මධ්‍යම පළාත් සභාවෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.211,399 ක් හා මුද්දර ගාස්තු රු.943,550 ක් ලැබියයුතුව පැවතුණි.**

**(ඈ) ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු**

**--------------------------------**

**2012 දෙසැම්බර් 07 දිනැති අංක 1788 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව බල ප්‍රදේශයේ ස්ථානගත කර ඇති ස්ථිර දැන්වීම් පුවරු 47 ක් සදහා එකතුව රු.194,500 ක ගාස්තු අයකරගෙන නොතිබුණි.**

(ඇ) පරිසර බලපත්‍ර ගාස්තු

------------------------

1988 අංක 56 සහ 2000 අංක 58 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව පරිසර බලපත්‍ර ලබා දියයුතු ව්‍යාපාරික ආයතන 15 කට අදාළව බලපත්‍ර ලබා නොදීම හේතුවෙන් රු.110,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය.

--------------------------

කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාන මාරු වී ගිය සේවකයින් 16 දෙනෙකුගෙන් අය වියයුතු හිග ණය ශේෂය වූ රු.935,503 ක මුදල අය කර ගැනීමට සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දි අයිතම 16 ක ඒකක 65 ක ඌනතාවයක් ද, අයිතම 11 ක ඒකක 23 ක අතිරික්තයක් ද අනාවරණය වී තිබුණි.

(ඇ) සභාව වෙනුවෙන් කර්මාන්ත 104 ක් සඳහා ප්‍රාග්ධන වියදම් වශයෙන් රු.22,344,033 ක ප්‍රතිපාදන ලැබී තිබුණු නමුත්, එයින් නිම කර තිබුණේ රු.8,744,900 ක් වටිනා කර්මාන්ත 85 ක් පමණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

-------------------------------------

4.1 සංයුක්ත සැළැස්ම.

----------------------

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු.

-----------------------------------

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය.**

**------------------------**

**සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.**

**5. පද්ධති හා පාලන**

**---------------------**

**පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ) ගිණුම්කරණය.**

**(ආ) ආදායම් පරිපාලනය.**

**(ඇ) ණයගැති හා ණයහිමි පාලනය.**

**(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.**